www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# හින්දු අධිපතිවාදීන් සහ මාධ්‍ය, ඉන්දියානු ආන්ඩුව තව දුරටත් දකුනට තල්ලු කරනු පිනිස මුම්බායි ජන ඝාතනය ඩැහැ ගනී

## Hindu supremacists, media seize on Mumbai atrocity to push India's government further right

**කීත් ජෝන්ස් විසිනි**

**2006 ජුලි 14**

අඟහරුවාදා සිදු වූ මුම්බායි ත්‍රස්තවාදී ජන ඝාතනය පිලිබඳව කෙරෙන පරීක්ෂනවලට සමීප නිලධාරින් කියා සිටින්නේ, ඉන්දියාවේ ජනාකීර්නම නගරයේ හා මූල්‍ය මධ්‍යස්ථානයේ දී මගී දුම්රිය හතක් ඉලක්ක කර ගෙන සම්බන්ධීකරනය කොට සිදු කල බෝම්බ පිපිරීම සංවිධානය කලේ කවරෙක් ද යන වග කීමට “සැලකිය යුතු දෙයක්” ඉක්මනින් ම හමු වනු ඇති බව යි.

හැකි තරම් උපරිම ජීවිත සංඛ්‍යාවක් බිලි ගැනීමේ එල්ලයෙන් සැලසුම් කොට තිබූ බෝම්බ ප්‍රහාරයෙන් බිලිගත් ජීවිත සංඛ්‍යාව, දැන් 200ක් වන අතර එය ඉහල යාමට සැම අතින් ම ඉඩ ඇත. බොහෝ සෙයින් දරුනු තුවාල ලැබූවන්ගෙන් යුක්ත තවත් 400කට අධික පිරිසක් තව මත් රෝහල්වල රැඳී සිටී.

ප්‍රහාරයෙන් පැය කිහිපයක් ඇතුලත. ඉන්දියානු බලධාරින් පැවසුවේ එය ලෂ්කාර්-ඉ-ටොයිබා (එල්ඊටී) -- මතභේදයට ලක්ව ඇති මුස්ලිම් බහුතරයකින් යුක්ත කලාපයක් වන කාශ්මීරයේ ඉන්දියානු විරෝධී සන්නද්ධ ව්‍යාපාරය තුල ක්‍රියාකාරී ඉස්ලාම්වාදී ත්‍රස්තවාදී සංවිධානයක් -- විසින් සිදු කරන ලද්දක් බවට තමන් බලගතු ලෙස සැක කරන බව යි.

ඉන්දියානු පොලීසියේ සහ ඔත්තු සේවා මූලාශ්‍රයන් දැන් පවසන්නේ, එල්ඊටී සංවිධානය ප්‍රහාරය තුල මූලික ක්‍රියා කලාපයක් ඉටු කල බවට සිය පරීක්ෂන මගින් දිගට ම පෙන්නුම් කෙරෙන බවයි. එහෙත් ඔවුන් තව දුරටත් කියා සිටියේ එල්ඊටී ක්‍රියාකාරින්ට ඉන්දියාවේ ඉස්ලාම් ශිෂ්‍ය ව්‍යාපාරයේ (එස්අයිඑම්අයි) සටන්කරුවන්ගේ සහයෝගය ලැබුනු බවට තමන් විශ්වාස කරන බව යි. ඉන්දියානු පදනමක් සහිත මුස්ලිම් වර්ගොත්තමවාදී සංවිධානයක් වන එස්අයිඑම්අයි ප්‍රමුඛ ස්ථානයකට පැමිනියේ 1992 දී හින්දු අධිපතිවාදීන් විසින් අයෝධ්‍යාහි බබ්රි මස්ජිද් මුස්ලිම් පල්ලිය විනාශ කර දැමීම මගින් අවුලුවා ලූ වාර්ගික ප්‍රචන්ඩත්වයේ රැල්ල තුල ය.

අඟහරුවාදා පටන් මේ දක්වා තමන් මුම්බායිහි හා සෙසු ප්‍රදේශවල කල සෝදිසි මෙහෙයුම්වල දී 300කට වැඩි පිරිසක් රඳවා ගෙන ඇතැයි ද ඔවුන්ගෙන් වැඩි දෙනෙක් එස්අයිඑම්අයි ක්‍රියාකාරීන් බව ද පොලීසිය වාර්තා කරයි.

එල්ඊටී හා එස්අයිඑම්අයි යන සංවිධාන දෙකෙහි ම නියෝජිතයන් තමන්ට අඟහරුවාදා බෝම්බ පිපිරීම් සමග කිසිදු සම්බන්ධයක් නැතැයි පවසා එම ප්‍රහාර සාහසික අපරාධ ලෙස හෙලා දැක ඇත. බ්‍රහස්පතින්දා දිල්ලි නුවර පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී එස්අයිඑම්අයි හිටපු සභාපති ෂහිඩ් බඩාර් ෆලාහි, “මනුෂ්‍ය වර්ගයාට එරෙහි අපරාධයක්” සම්බන්ධයෙන් තමන්ට සාවද්‍ය චෝදනා නැගීම මගින් “එස්අයිඑම්අයි සංවිධානය හිතාමතාම අපකීර්තියට ලක් කිරීමට” උත්සාහ කිරීම ගැන “ආන්ඩුවේ මාධ්‍යවලට” සහ හින්දු අධිපතිවාදී “ආර්එස්එස් හා බජ්රාං දාල්” සංවිධානවලට චෝදනා කලේ ය.

යොදා ගෙන තිබූ පුපුරන ද්‍රව්‍යවල ස්වභාවය හා බෝමබ පිපිරීම් මාලාව සම්බන්ධීකරනය කොට තිබූ ආකාරය, මීට පෙර එල්ඊටී ප්‍රහාර හැම එකක දී ම දක්නට ලැබුනු තත්වය කැපී පෙනෙන ලෙස ඉක්මවා ගිය, ඉතා ඉහල මට්ටමේ සූක්ෂ්ම ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරන බව හැරෙන්ට ආන්ඩුව, පොලීසිය හා ඔත්තු සේවා නිලධාරින් ප්‍රහාරය ගැන වැඩි යමක් කියා නැත.

මෙවන් ප්‍රහාරයක් සූදානම් වන බවට යෝජනා කරන මොන යම් හෝ ඔත්තු සේවා වාර්තාවක් අධිකාරින්ට ලැබුනේ ද යන වග පිලිබඳව එකිනෙකට බෙහෙවින් පරස්පර වාර්තා විවිධ නිලධාරින් විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. මුම්බායි අගනගරය වන මහාරාස්ට්‍ර ප්‍රාන්තයේ නියෝජ්‍ය මහ ඇමති ආර්.ආර්. පටිල් *ටයිම්ස් ඔෆ් ඉන්දියා* පත්‍රයට කියා සිටියේ, ඔත්තු සේවාවන්ගේ පාර්ශ්වයෙන් විශාල අසාර්ථකත්වයක් සිදුව ඇති බව යිඃ “අසාර්ථක වී ඇත්තේ හුදු ප්‍රාන්ත ඔත්තු සේවා දෙපාර්තමේන්තුව හා ප්‍රභූ ත්‍රස්ත විරෝධී බලඇනිය පමනක් නොවේ. මධ්‍යම ආන්ඩුවේ ඔත්තු සේවා කාර්යංශයට පවා පිපිරීම් ගැන අදහසක් තිබුනේ නැත.” එහෙත් මහාරාස්ට්‍ර ප්‍රාන්තයේ පොලිස් ප්‍රධානි පී.එස්.

පස්රිචා කියා ඇත්තේ මුම්බායි ඉලක්කයක් බව පොලීසිය "මාස ගනනාවක්" තිස්සේ දන සිටි බව යි.

ඉන්දියාවේ ඔත්තු සේවා ඒජන්සියක් වෙනුවෙන් වැඩ කරන ප්‍රකෝපකාරි ඒජන්තයන් අඟහරුවාදා ජන ඝාතනයට පහසුකම් සැලසුවා ය යන්න නැත හොත් ආරක්ෂක හමුදාවන් තුල සිටින කොටස්, රාජ්‍යය අතට වඩ වඩා මර්දන බලතල ලබා දීමක් පිලිගැනීම කරා මහජනතාවගේ භීතිය ඇවිලවීමේ එල්ලය ඇතිව, ත්‍රස්තවාදී ප්‍රහාරය සිදු වීමට ඉඩ හැරියා ය යන්න බැහැර කල නොහැකි ය. එමෙන් ම, මුම්බායි බෝම්බ පිපිරීම් මුස්ලිම් විරෝධී ප්‍රචන්ඩත්වය ඇවිලවීමේ, ඉන්දු-පකිස්ථාන සාම ක්‍රියාදාමයට වල කැපීමේ හා කොංග්‍රස් පක්ෂයේ නායකත්වයෙන් යුත් ප්‍රාන්ත හා මධ්‍යම ආන්ඩු අස්ථාවර කිරීමේ එල්ලය ඇතිව, හින්දු අධිපතිවාදී උන්මත්තක කොටස් සිදු කල ක්‍රියාවක් වීමට ද ඉඩ ඇත.

බදාදා සැන්දෑවේ ජාතිය අමතා රූපවාහිනියෙන් කල කතාවක දී ඉන්දියානු අගමැති මන්මෝහන් සිං, ත්‍රස්තවාදය පරාජය කරන බවට සපථ කොට, මුම්බායි ආර්ථිකව ශක්තිමත්, "ඒක්සත්" හා "අන්තර්ගත" ඉන්දියාවක සංකේතයක් ලෙස ඉදිරිපත් කල අතර "කටකතාවලින් කුපිත" නොවන ලෙස මහජනතාවගෙන් ඉල්ලා සිටියේ ය. මෙය වනාහි මුස්ලිම් විරෝධී ස්වෝත්තමවාදය ඇවිස්සීම පිනිස මුම්බායි ප්‍රහාරය පිලිබඳ වෛරය යොදා ගැනීමට ඉන්දියාවේ නිල විපක්ෂය වන භාරතීය ජනතා පක්ෂය හා එහි හින්දු අධිපතිවාදී සගයන් දරන ප්‍රයත්නයට කෙරුනු වක්‍ර සැඳහුමකි.

සිය කතාව තුල දී, සිං, අඟහරුවාදා ජන ඝාතනය වගකිව යුතු යැයි කිසිදු කන්ඩායමකට චෝදනා නොකල අතර, ඉන්දියානු ජම්මු හා කාශ්මීර ප්‍රාන්තය තුල සන්නද්ධ කැරැල්ල සම්බන්ධයෙන් මුලුමනින් ම නොවේ නම් බොහෝ සෙයින් වගකිව යුතු යැයි ඉන්දියානු සංස්ථාපිතයේ චෝදනාවට ලක් වන පකිස්ථානය ගැන කිසිදු සඳහනක් ද කලේ නැත.

කෙසේ වෙතත්, එදින ම ඊට පෙර, ඉන්දියානු ආන්ඩුවේ නිලධාරියෙක්, පකිස්ථාන විදේශ ඇමති කුර්ෂිඩ් කසුරිගේ ප්‍රකාශයකට පසුව, පකිස්ථාන විරෝධී පූර්වචානම් හඬ තැලී ය. කසුරි, ඉන්දියානු-පකිස්ථාන සාම සාකච්ඡාවල මන්දගාමී ප්‍රගතිය විවේචනයට ලක් කොට "දකුනු ආසියාවේ අන්තවාදය සමග පොර බැදීමේ හොඳම ක්‍රමය" වනු ඇත්තේ කාශ්මීර මතභේදය ඇතුලු ප්‍රධාන ගැටලු සමග පොර බැදීම යැයි පැවසී ය.

පකිස්ථානය මුම්බායි ප්‍රහාරය හෙලා දකින බව කසුරි යලිත් සඳහන් කොට තිබූ නමුත්, ඔහු ත්‍රස්තවාදය වෙනුවෙන් ක්ෂමාලාප ඉදිරිපත් කරන බවට ද එය කේවල් කිරීමේ තුරුම්පුවක් ලෙස යොදා ගන්නා බවට ද ඉන්දියානු විදේශ කටයුතු ප්‍රකාශක නව්තෙජ් සර්නා චෝදනා කලේ ය. කසුරිගේ ප්‍රකාශ මගින් "පෙනී යන්නේ දේශ සීමා හරහා ක්‍රියාත්මක වන ත්‍රස්තවාදය නමැති වසංගතයට එරෙහිව පකිස්ථානය ඉන්දියාව සමග සහයෝගයෙන් කටයුතු කරනු ඇත්තේ ඊනියා මතභේද විසඳුව හොත් පමනක් බවට කෙරෙන යෝජනාවක්" යැයි සර්නා පැවසී ය. ඔහු ඊලඟට පකිස්ථානයෙන් ඉල්ලා සිටියේ, "තම දේශ සීමාව තුල පවත්නා ත්‍රස්තවාදී පොදු කාර්ය ව්‍යුහය කඩා බිඳ දමනු" පිනිස මීට වඩා ක්‍රියාත්මක වන ලෙස යි.

2004 මැයි මහ මැතිවරනයෙන් බීජේපී නායකත්වයෙන් යුත් ජාතික ප්‍රජාතන්ත්‍ර සන්ධානයේ (එන්ඩීඒ) සභාග ආන්ඩුව බලයෙන් පහ වීමේ පටන් මේ දක්වා අවුල් වියවුල්වල ගිලී සිටින හින්දු අධිපතිවාදී දක්ෂිනාංශය, සිය දේශපාලනිකව විෂසෝර න්‍යාය පත්‍රය තොරොම්බල් කරනු පිනිස මුම්බායි ඛේදවාචකය ගසාකෑමට උත්සාහ කරයි. මෙහි දී මතකයට නගා ගත යුත්තේ, එන්ඩීඒ ආන්ඩුව, ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත (පීඕටීඒ -- පොටා) නම් වූ දරුනු පනත සම්මත කරගැනීමත් පකිස්ථානයට තර්ජනය කිරීමේ හා එම රට බිය ගැන්වීමේ ප්‍රයත්නයක් ලෙස වසරකට ආසන්න කාලයක් තිස්සේ යුද සූදානමක ඉන්දියාවේ මිලිටරිය තැබීමත් පිනිස 2001 දෙසැම්බරයේ ඉන්දියානු පාර්ලිමේන්තුවට එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරය ඩැහැගත් බව යි. එම ප්‍රහාරය සම්බන්ධයෙන් ද එල්ටීටී සංවිධානයට චෝදනා එල්ල කෙරුනි.

බදාදා බීජේපී නායකත්වය සම්මත කල යෝජනාවක්, ඡන්ද පසුපස යාම -- එනම්, මුස්ලිම් වැසියන්, සෙසු සුලුතර කොටස් හා නක්සල්වාදීන් (මාඕවාදී කැරලිකරුවන්) "සතුටු කිරීම" -- හේතු කොට ගෙන ත්‍රස්තවාදයට එරෙහිව සටන් වැදීමට කොංග්‍රස් පක්ෂයේ නායකත්වයෙන් යුත් එක්සත් ප්‍රගතිශීලී සන්ධාන (යූපීඒ) ආන්ඩුව අපොහොසත් වී ඇතැයි චෝදනා කලේ ය. බීජේපීය මෙසේ ප්‍රකාශ කලේ යඃ "යූපීඒ, . . . ත්‍රස්තවාදයේ පොදු කාර්ය ව්‍යුහයට වැඩීථ තමන්ගේ ම වර්ධනය වැඩි දියුනු කර ගෙන රටේ වියවුල් ඇති කල හැකි වාතාවරනයක් නිර්මානය කර ඇත. . . . බීජේපීය ඉල්ලා සිටින්නේ යූපීඒ ආන්ඩුව ඡන්දය හෝ ඉන්දියාව යන දෙකෙන් එකක් තෝරා ගත යුතු බව යි. එය එක්කො ආන්ඩු කල යුතු ය නැති නම් ගෙදර යා යුතු ය."

මුස්ලිම් ප්‍රජාව, දලිත් ජනයා (අතීතයේ දී අතින් වත් ඇල්ලීමට නුසුදුසු අය ලෙස හැඳින්වුනු ජනයා) සහ ඉඩම් වෙනුවෙන් සටන් කරන ගොවි හා ගෝත්‍රික ජනයා ත්‍රස්ත කිරීමට එම නීතිය යොදා ගන්නා බවට මිනිස් අයිතිවාසිකම් පිලිබඳ සංවිධානවලින් සහ ප්‍රධාන ධාරාවේ දේශපාලන පක්ෂවලින් පවා එල්ල වූ අනේක

විධ පැමිනිලිවලට ප්‍රතිචාර වසයෙන්, 2004 සැප්තැම්බරයේ දී යූපීඒ විසින් අහෝසි කරන ලද පොටා (එහෙත් එහි අඩංගු දරුනුම විධිවිධාන දිගට ම පවත්වා ගනිමින්) යලි බලාත්මක කිරීමට යූපීඒ ආන්ඩුව පියවර ගත යුතු යැයි බීජේපීය ඉල්ලා සිටී.

තමන් මෙම සති අන්තයේ දී දෙදින "ත්‍රස්ත විරෝධී" උද්සෝෂනයක් පවත්වන බවත් එම උද්සෝෂනයේ කොටසක් වසයෙන් ගුජරාටි මහ ඇමති නරේන්ද්‍ර මෝඩි මුම්බායිහි සංචාරයක යෙදෙන බවත් බීජේපීය නිවේදනය කර තිබේ. මෝඩි මුම්බායි නුවරට යැවීම කිසිදු වග විභාගයකින් තොරව ක්‍රියාවට දැමෙන නග්න ප්‍රකෝපකරනයකි. මිනිසුන් 2000ක් දක්වා ප්‍රමානයක් ඝාතනය කරමින් දස දහස් ගනනකට උන් හිටි තැන් අහිමි කල 2002 දී ගුජරාටයේ ක්‍රියාවට දැමුනු මුස්ලිම් විරෝධී ජන සංහාරය උසිගැන්වූ තැනැත්තා ලෙස ඔහු අපකීර්තියට ලක්ව ඇත.

මහාරාෂ්ට්‍රය පදනම් කර ගෙන ක්‍රියාත්මක වන බීජේපීයේ සගයකු වන ෂිව සේනා සංවිධානය, කොංග්‍රස් නායකත්වයෙන් යුත් ප්‍රජාතන්ත්‍ර පෙරමුනේ ප්‍රාන්ත ආන්ඩුව අස්ථාවර කරනු පිනිස උද්සෝෂනයක් දියත් කිරීමට මාන බලයි. "මෙම ආන්ඩුවේ පිලිවෙත් සුලුතර කොටස් සතුටු කිරීම මත පදනම් වන හෙයින් එය මහාරාෂ්ට්‍රය ආරක්ෂා කිරීමට අපොහොසත් අතර ත්‍රස්තවාදය පරාජය කිරීම ද එයට කල නොහැකි ය," යැයි ෂිව සේනා සංවිධානයේ පරම නායක බාල් තැකරේ බ්‍රහස්පතින්දා පක්ෂ පුවත්පතෙන් ප්‍රකාශ කලේ ය.

මේ අවස්ථාවේ ෂිව සේනා සංවිධානයේ ඉලක්කය බවට පත්ව සිටින අනෙක් ප්‍රධාන පාර්ශ්වය නම් රැකියා අවස්ථාවන් සොයා ගෙන මුම්බායි නගරයට එක් රොක්ව සිටින බංග්ලාදේශයෙන් පැමිනි දුගී කම්කරුවන් ය. කිහිප සියයක ෂිව සේනා සාමාජිකයන් හා ආධාරකරුවන් සහභාගි වූ බදාදා පැවති විරෝධතා ව්‍යාපාරයක්, පසු ගිය දශක තුනක කාලය තුල ඉන්දියාව තුල පදිංචි වී ඇති දශ ලක්ෂයක් පමන වන බංග්ලාදේශ වැසියන් පිටුවාහල් කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලෙස ප්‍රාන්ත පරිපාලනයෙන් ඉල්ලා සිටියේ ය.

## සංගත මාධ්‍ය හින්දු දක්ෂිනාංශයේ අදහස් ප්‍රතිරාවය කරයි

සංගත මාධ්‍යවල වැදගත් කොටස්, හින්දු අධිපතිවාදීන්ගේ ගිනි අවුලුවන සුලු මුස්ලිම් විරෝධී පූර්වානම් යොදා නොගන්නා නමුත්, ත්‍රස්තවාදයට එරෙහිව සටන් වදිනු පිනිස රාජ්‍යයේ මර්දන බලතල වැඩි කරන ලෙසත් කාශ්මීරයේ ඉන්දියානු විරෝධී සන්නද්ධ කැරැල්ලට ලබා දෙන ද්‍රව්‍යමය හා දේශපාලන සහයෝගය පවා කපා හරින ලෙස පකිස්ථානයෙන් කරන ඉල්ලීම් යලි අලුත් කරන ලෙසත් හින්දු අධිපතිවාදීන් ආන්ඩුව වෙත කරන කෑඳවුම්, ප්‍රතිරාවය කර ඇත.

"මේ ආන්ඩුව ත්‍රස්තවාදය සම්බන්ධයෙන් කරන්නේ මොනවාද?" යන මැයෙන් යුක්ත කතුවැකියකින් *නිව් ඉන්දියන් එක්ස්ප්‍රස්* පත්‍රය මෙසේ පැමිනිලි කර සිටියේ යඃ "සංකීර්න දේශපාලන සාධක මාලාවක් මගින්, . . . තමන් ත්‍රස්තවාදය සම්බන්ධයෙන් කෙතරම් තදින් ක්‍රියා කල යුතු ද යන්න හරියට ම නොදන්නා බවක් පෙනී යන තත්වයකට යූපීඒ ආන්ඩුව පත් කරනු ලැබ ඇත. පසු ගිය වසරේ දිල්ලි දීපවාලි බෝම්බ පිපිරීම්වලින් පසුව, බැංගලෝර් ප්‍රහාරයෙන් පසුව, වරනාසි බෝම්බ ප්‍රහාරයෙන් පසුව, කාශ්මීරයේ බොහෝ ඝාතනවලින් පසුව විවිධ ආකාරයන්ගෙන් අපි මෙය දැක ඇත්තෙමු. . . ."

*හින්දුස්ථාන ටයිම්ස්* ආරක්ෂක හමුදාවන්ට වැඩි බලතල දීම හා පකිස්ථානය සම්බන්ධයෙන් දරන ආකල්ප දැඩි කිරීම යන දෙක ම ඉල්ලා සිටියේ යඃ "දැන් නම් හොඳට ම ඇති බවත් අල්ලපු ගෙදර (පකිස්ථානයේ) ජිහාද් සාධකය සම්බන්ධයෙන් වහාම, යමක් කල යුතු බවත් ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය තුල සිටින අපගේ මිතුරන්ට කිව යුතු ය. එහි සෙවන ලබන, අවශ්‍ය කර තිබෙන ත්‍රස්තවාදීන් ඉන්දියාවට බාර දීම සහතික කර ගනු පිනිස තවත් බොහෝ දේ කිරීමට ඇතැයි ඔවුන්ට පැවසිය යුතු ය."

ඉන්දියාවේ ප්‍රමුඛතම ලිබරල් පුවත් පත යැයි කිව හැකි සහ මේ වන තෙක් ම පකිස්ථානය හා ඉන්දියාව අතර සංහිඳියාවේ උනන්දු සහගත ආධාරකරුවකු වූ *හින්දු* පත්‍රය, කාශ්මීර සන්නද්ධ කැරැල්ලට දෙන සහයෝගය මුලුමනින් ම නතර කරන්නැයි ඉස්ලාමාබාදයෙන් ඉල්ලා සිටින ලෙස යූපීඒ ආන්ඩුවට කියා සිටියේ, නැති නම් සාම ක්‍රියාදාමය බිඳ වැටිය හැකි යැයි අනතුරු අඟවමිනි. "ඉන්දියාව ඉලක්ක කර ගත් ත්‍රස්තවාදය අවසන් කරන බවට එය නැවත නැවතත් දුන් පොරොන්දු ඉටු කරන ලෙස පකිස්ථානයට බල කරනු පිනිස වැඩෙන ජාත්‍යන්තර වෛරය යෙදා ගැනීමට අගමැතිට" ඇති "අවස්ථාව මෙයයි" යනුවෙන් *හින්දු* ප්‍රකාශ කලේ ය. "ඉන්දියානු-පකිස්ථාන සංහිඳියාවේ අනාගතය ඔහුට මෙය කිරීමට ඇති හැකියාව මත රඳා පවතිනු ඇතැයි සත්තකින් ම තර්ක කල හැකි ය. ඒ සෑම ත්‍රස්තවාදී ප්‍රහාරයක් ම, සංහිඳියා ක්‍රියාදාමයේ පදනම ලෙස ක්‍රියා කරන මහජන සහයෝගය නමැති ජලාශයේ හිඳී යාමට දායක වන බැවිනි. . . .

"බටහිර බලාත්කාරී බලතලවලට සීමාවන් පවතී ය යන්න, ඉරානය හා උතුරු කොරියාව එක්සත් ජනපදයේ ආඥාවන් නොතකා ක්‍රියා කිරීම මගින් පෙන්නුම් කෙරේ යැයි ද මොනවා වුනත් ඉන්දියාවට එරෙහි ජිහාද්

ව්‍යාපාරය විශාල මූලෝපායික වියදමකින් තොරව පොලඹවාලිය හැකි යැයි ද පකිස්ථාන මිලිටරි සංස්ථාපිතයේ ජිහාද්වාදීන්ට පක්ෂපාතී කොටස් විශ්වාස කරනවා විය හැකි ය. ලෂ්කාර් සංවිධානයේ උපරිම ත්‍රස්තය සමග පොර බැදීම දැඩි අභියෝගයන් මතු කරයි. එහෙත් පුනරාවර්තන ත්‍රස්ත ක්‍රියාවන්ට මුහුන දෙන තතු තුල ඉන්දියාවේ විකල්ප පිලිබඳ කෙරෙන බැරෑරුම් විශ්ලේෂනයක් මත පාදක වන දැඩි තීන්දු ගැනීම තව දුරටත් කල් පමා කල නොහැකි ය."

ලෂ්කාර් මුම්බායි බෝම්බ පිපිරීමට වගකිව යුතු යැයි ද එය එහි දී ක්‍රියා කලේ පකිස්ථාන ආන්ඩුවේ හෝ එහි මිලිටරි-ඔත්තු සේවා තන්ත්‍රයේ කොටස්වල ඉල්ලීම නැත හොත් ඔවුන්ගේ ආරක්ෂාව යටතේ ය යනුවෙන් හින්දු කරන කියාපෑම් සඳහා සාක්ෂ්‍ය ලෙස ඇත්තේ ඉන්දියාවේ ආරක්ෂක සංස්ථාපිතයේ ප්‍රකාශ පමනකි යන්න අමුතුවෙන් පැවසිය යුතු නැත.

එහෙත් එය සත්‍යය වුනා වුවත්, ඉන්දියාවේ ත්‍රස්තවාදී ප්‍රශ්නය "පකිස්ථානයේ නිපදවන ලද" දෙයක් බවට කරන කියාපෑම පහසුවෙන් ම නොතකා හරින්නේ, ඉන්දියානු පාලක පන්තිය හින්දු අධිපතිවාදයට දෙන අනුග්‍රහය, 1947 උප-මහාද්වීපය වාර්ගිකව බෙදා වෙන් කිරීම තුල දී කාශ්මීරයේ පාලනය ඩැහැ ගැනීම පිනිස එය යොදා ගත් කුටෝපායන්, කාශ්මීර හා සෙසු බෙදුම්වාදී නැගිටීම් මැඩීමේ දී එය පෙන්වා ඇති රුදුරු භාවය, දලිත් හා ගෝත්‍රික ජනයා මත එය පටවා ඇති වෙනස්කම් සහ දශක ගනනාවක් තිස්සේ පකිස්ථානය සමග එයට පවත්නා භූ-දේශපාලනික ප්‍රතිවාදිත්වයේ කොල්ලකාරී ස්වභාවය යි.

## ඉන්දියාව, එක්සත් ජනපදය සහ පකිස්ථානය

බීජේපී නායකත්වයෙන් යුත් ආන්ඩුව 2001 දී ඉන්දියානු පාර්ලිමේන්තුවට එල්ල වූ ප්‍රහාරයට දැක්වූ ආක්‍රමනශීලී ප්‍රතිචාරයේ ආලෝකයෙන් ගත් කල, මුම්බායි බෝම්බ ප්‍රහාරයට යූපීඒ ආන්ඩුව දක්වූ ප්‍රතිචාරය මෘදු හා පාලිත එකක් බව පෙනී යයි.

එහෙත් යූපීඒ ආන්ඩුව ඉන්දියාවේ දේශීය දේශපාලනයේ හා විදේශ පිලිවෙතේ සැලකිය යුතු වෙනස්කම් සිදු කිරීමට උත්සාහ දරනු පිනිස බෝම්බ පිපිරීම් යොදා ගනු නැතැයි තීන්දු කිරීමට මෙය ඉක්මන් වැඩි ය. නිසැකව ම, ඉහත උපුටා දක්වන ලද කතුවැකි මගින් පෙන්නුම් කෙරෙන පරිදි, ඉන්දියානු මහ ව්‍යාපාරිකය ආන්ඩුව තියුනු ලෙස දකුනට තල්ලු කරනු පිනිස බෝම්බ ප්‍රහාර යොදා ගනී.

ආන්ඩුව පොලීසියට හා ඔත්තු ඒජන්සිවලට නව බලතල දෙනු ඇතැයි යෝජනා කරමින්, "ඉතා ඉක්මනින් ම" ආන්ඩුව "පවත්නා (ආරක්ෂක) පද්ධති ශක්තිමත් කිරීමට සමහර පියවර ගනු" ඇතැයි ස්වදේශීය ඇමති ශිවරාජ් පටිල් පොරොන්දු වී තිබේ.

සාම ක්‍රියාදාමය කඩාකප්පල් කිරීම මුම්බායි බෝම්බකරුවන්ගේ එක අරමුනක් වී යැයි තර්ක කරමින්, කොංග්‍රස් නායකත්වයෙන් යුත් යූපීඒ, පකිස්ථානය සමග සංහිඳියාව යලි සලකා බැලීමට හෝ මන්දගාමී කිරීමට ලක් කල යුතු බවට කෙරුනු ඉල්ලීම් ප්‍රතික්ෂේප කර ඇත. "(පකිස්ථානය සමග) විශ්වාසය ගොඩනැගීමේ පියවර අඛන්ඩව ක්‍රියාත්මක වනු ඇතැ" යි ස්වදේශ ලේකම් වී.කේ. ඩුගල් ප්‍රකාශ කලේ ය. "සාම ක්‍රියාදාමය මන්දගාමී නොකෙරෙනු ඇත."

එහෙත්, නව දිල්ලිය ඉස්ලාමාබාදය මත නව ඉල්ලීම් පැටවීමේ හැකියාවක්, -- විශේෂයෙන් ම, ස්වකීය අරමුනු සාක්ෂාත් කරගනු වස් එවන් ක්‍රියාවන් ප්‍රයෝජනවත් යැයි බුෂ් පාලනාධිකාරය සිතුව හොත් -- මෙම ප්‍රකාශ මගින් බැහැර කෙරෙන්නේ නැත.

ඉන්දු-එක්සත් ජනපද "ගෝලීය" මූලෝපායික හවුල්කාරිත්වයක් ඇති කර ගනු වස් ගෙන යන සාකච්ඡාවල වත්මන්, සංවේදී තත්වය හමුවේ -- ලෝක න්‍යෂ්ටික තන්ත්‍රය තුල ඉන්දියාවට අනන්‍ය තත්වයක් ප්‍රදානය කිරීමේ එල්ලය සහිත පනතක් මේ දිනවල එක්සත් ජනපද කොංග්‍රසයේ සාකච්ඡාවට ලක් වෙමින් තිබේ -- නව දිල්ලිය පකිස්ථානය පිලිබඳ සිය ආස්ථානයේ සිදු කරන මොන යම් හෝ වෙනසක් වොෂිංටනය සමග සමීපව සම්බන්ධීකරනය කරන බව නිසැක ය.

බුෂ් පාලනාධිකාරයේ ත්‍රස්ත විරෝධී යුද්ධයෙහි ප්‍රධාන සගයකු ලෙස ජනරාල් පර්වේස් මුෂාරෆ්ට පවතින තත්වය කෙසේ වෙතත්, වොෂිංටනය හා මුෂාරෆ්ගේ පකිස්ථාන තන්ත්‍රය අතර සබඳතා වඩ වඩා ආතති සහගත බවට පත්ව තිබීම අර්ථභාරි ය. කාශ්මීරය සම්බන්ධයෙන් පකිස්ථානයට මොන යම් හෝ සැලකිය යුතු සහනයක් දීම නව දිල්ලිය ප්‍රතික්ෂේප කරන තතු යටතේ පවා, වොෂිංටනය ඉන්දියාව සමග හැකි තාක් සමීප හවුල්කාරිත්වයකට අවතීර්නවීම සම්බන්ධයෙන් ඉස්ලාමාබාදය වොෂිංටනය සමග උරනව සිටී. වොෂිංටනය, තමන්ගේ පාර්ශ්වයෙන්, පකිස්ථානය තුල සරන සොයා ගෙන පැමින ඇති තලිබාන් සටන්කරුවන් අල්ලා ගැනීමට පකිස්ථානය ඇති තරම් ක්‍රියා කරන්නේ නැතැයි වොෂිංටනයේ ඇෆ්ඝන් රූකඩයා වන හමිඩ් කර්සායි කරන පැමිනිලි ප්‍රතිරාවය කර තිබේ.

බදාද, එක්සත් ජනපද රාජ්‍ය ලේකම් කොන්ඩලීසා රයිස්, වොෂිංටනයේ පැවති ද්වි-පාර්ශ්වීය සාකච්ඡා අවසානයේ දී පකිස්ථාන විදේශ ඇමති සමග ඒකාබද්ධ

ප්‍රවෘත්ති සම්මන්ත්‍රනයක් පැවැත්වීම, කිසිදු හේතු දැක්වීමකින් තොරව, ප්‍රතික්ෂේප කලා ය.

බ්‍රහස්පතින්දා එක්සත් ජනපද ජනාධිපති ජෝර්ජ් බුෂ් මන්මෝහන් සිංට දුරකතනයෙන් කතා කල අතර, ශාන්ත පීටර්ස්බර්ග් නුවර ජී-8 සමුලුව පැවැත්වෙන අතරතුර දී තමන් මුන ගැසුන විට ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම පිලිබඳව සංකේන්ද්‍රනය වූ සාකච්ඡාවක් පැවැත්වීමට ඔවුන් තීන්දු කල බව ද වාර්තා විය.

එක්සත් ජනපද අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි සිය දේශීය හා ජාත්‍යන්තර පිලිවෙත් වඩ වඩා යොමු කරන ලෙස මුෂාරෆ්ට බල නොකිරීම සම්බන්ධයෙන් බුෂ් පාලනාධිකාරය දිගු කලක් තිස්සේ විවේචනයට ලක් කර ඇති *වොෂිංටන් පෝස්ට්* පත්‍රය, මුම්බායි බෝම්බ පිපිරීමෙන් ඉක්බිතිව, පකිස්ථානය දැඩි ලෙස විවේචනය කරන විවරන ලිපියක් පල කලේ ය. එම ලිපියේ කතුවරයා වූ ක්ෂිනියා ඩෝර්මැන්ඩි පසු ගිය අගෝස්තු මාසය වන තෙක් ම බුෂ් පාලනාධිකාරයේ ජාතික ආරක්ෂක මන්ඩලයේ දකුනු ආසියාව පිලිබඳ අධ්‍යක්ෂ විය. "(පකිස්ථානයට එරෙහිව) ප්‍රතික්‍රියා කිරීමට ඔවුන්ට සිදු වන තෙක් ඉන්දියාවට, ඉන්දියානුවන්ට හා සිං ආන්ඩුවට සටන්කාමී කන්ඩායම් වෙතින් නැගෙන අඛන්ඩ පීඩනයට කොතෙක් කල් දරා සිටිය හැකි ද?" යනුවෙන් ඩෝම්මැන්ඩි විමසී ය. "ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රිකභාවයේ ඕනෑම මිම්මකට අනුව, ඔවුන් අත්‍ය-සාමාන්‍ය ඉවසීමක් දැනටමත් පෙන්නුම් කර ඇත. ඔවුන්ගේ හික්මීම සිය සොල්දාදුවන් පැහැර ගෙන යාමට ඊශ්‍රායලය දැක්වූ ප්‍රතිචාරය සමග හෝ උතුරු කොරියාවේ මිසයිල අත්හදා බැලීම සම්බන්ධයෙන් එක්සත් ජනපදය හා ජපානය දැක්වූ ප්‍රතිචාරය සමග සසඳන්න.

"කලාපයේ වගකිව යුතු සාමාජිකයකු ලෙස සලකනු ලැබීමක්" එය බලාපොරොත්තු වන්නේ නම්, "මෙය පකිස්ථානය ඇත්තට ම ප්‍රතිචාර දැක්විය යුතු මොහොතකි."

© www.wsws.org